# 16 - ඉස්ලාම්

## අවසාන ලකුණු ගණනය කිරීම

### I ප්‍රශ්න පත්‍රය

බහුවරණ 1 - 40 = 1 x 40 40 = 40

### II ප්‍රශ්න පත්‍රය

1 ප්‍රශ්නය (අනිවාර්ය)

1 - 10 දක්වා = 2 x 10 20 = 20

2 ප්‍රශ්නය ( 2 - 6 තෙක් තෝරාගත් ප්‍රශ්න 04 කට)

i කොටස ලකුණු 2
ii කොටස ලකුණු 3
iii කොටස ලකුණු 5 10

7 ප්‍රශ්නය - කෙටි සටහන් දෙකක් සඳහා

5 + 5 10

එකතුව 04 x 10 = 40

100

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක** 03

(i) .................................................... √ △ $\frac{4}{5}$
....................................................
....................................................

(ii) .................................................... √ △ $\frac{3}{5}$
....................................................
....................................................

(iii) .................................................... √ △ $\frac{3}{5}$
....................................................
....................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

WWW.OLEVELAPI.COM

### බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.** අදාළ විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

WWW.OLEVELAPI.COM

**සැ.යු :- සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කළ යුතු ය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

***

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**16 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

ඉස්ලාම් I, II
இஸ்லாம் I, II
Islam I, II

2019.12.02 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

## ඉස්ලාම් I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ** (X) **ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** නබිතුමාට ප්‍රථම වතාවට **වහි** ප්‍රකාශ කළ විට වාක්‍ය කීයක් පාරායන කරන ලද්දේ ද?
(1) එකකි (2) දෙකකි (3) හතරකි (4) පහකි

**2.** මුස්ලිම්වරයකු ඉටු කළ යුතු කටයුතු තුනකි. ඉන් එකක් **ඉමාරත්** වේ. අනෙක් දෙක මොනවා ද?
(1) රිසාලත්, මආද් (2) මආද්, කිලාෆත් (3) ඉබාදත්, කිලාෆත් (4) කිලාෆත්, තව්හීද්

**3.** අරාබි අර්ධ ද්වීපයේ බටහිර සීමාව කුමක් ද?
(1) සිරියා කාන්තාරය (2) රතු මුහුද
(3) අරාබි මුහුද (4) පර්සියානු බොක්ක

**4.** **ෆර්ලු** වූ සලාතයෙන් පසුව පහත සඳහන් කුමක් පාරායනය කිරීමෙන් ඊළඟ සලාත් වේල දක්වා අල්ලාහ්ගේ ආරක්ෂාවේ සිටින්නේ යැයි නබිතුමා සඳහන් කර තිබේ ද?
(1) කුල් සූරාවන් පාරායනය කිරීම (2) සූරතුල් මුඅව්විදතයින් පාරායනය කිරීම
(3) ආයතුල් කුර්සි පාරායනය කිරීම (4) සූරා යාසීන් පාරායනය කිරීම

**5.** පහත දෙයින් **වුලු** සිදුකිරීමට යෝග්‍ය ජලය කුමක් ද?
(1) වර්ෂාව, හිම, අයිස් කැට ජලය
(2) පිනිවතුර වැනි මිශ්‍රණ සහිත ජලය
(3) කුරුම්බා වතුර වැනි ස්වභාවික ජලය
(4) පිරිසිදු එහෙත් පෙර වුලු දෝවනය සඳහා භාවිත කළ ජලය

**6.** ඉස්ලාම් දහමින් ඉවත්වීම රිද්දත් ලෙස හැඳින්වේ. **දෙවියන් නැත** යනුවෙන් සඳහන් කිරීම හඳුන්වන්නේ,
(1) නිෆාක් ලෙස ය. (2) ෆසාද් ලෙස ය. (3) ඉල්හාද් ලෙස ය. (4) කුෆ්ර් ලෙස ය.

**7.** යම් භාණ්ඩයක් විකුණන විට එහි ගැණුම් මිල, ලාභය ආදිය පාරිභෝගිකයා දැන සිටි විටක දී සිදුවන වෙළෙඳ ක්‍රමය කුමක් ද?
(1) මුෂාරකා (2) මුළාරබා (3) මුදාරආ (4) මුරාබහා

**8.** කෙනෙක් සතුව එළුවන් 110 දෙනෙකු සිටින විට ඔහු ගෙවිය යුතු zසකාත් ප්‍රමාණය කුමක් ද?
(1) එක් පිරිමි එළුවෙක් (2) එක් එළිච්චියක්
(3) එළිච්චියන් දෙදෙනෙක් (4) පිරිමි එළුවන් දෙදෙනෙක්

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...



9. **වහි කෙරූ මත්ලූව්වූ** යන්නට නිදසුන් වන්නේ පහත දේවලින් කුමක් ද?
(1) සහාබාවරුන්ගේ අදහස්
(2) නබිතුමාගේ හදීස්
(3) සහාබාවරුන්ගේ ඉජ්මා
(4) කුර්ආන්, හදීස්වලට වෙනස් නොවන දේ

10. ඉද්රීස් (අලෛ), ඉබ්රාහීම් (අලෛ) යන අයට දායාද කළ **සුහුෆු** සංඛ්‍යාවන් පිළිවෙළින් කොපමණ ද?
(1) 10, 10
(2) 10, 50
(3) 30, 10
(4) 50, 50

11. පහත සඳහන් අරාබි වචන අතුරෙන් ඉස්ලාමීය විවාහය හා සම්බන්ධ වූ වචන අඩංගු වරණය තෝරන්න.
A - මහර්
B - රිළා
C - වලි
D - මහ්රම්
E - තක්රීර්
F - අස්සුලූක්
G - තවක්කුල්
H - වලීමා

(1) ABCD
(2) ACDH
(3) BDGH
(4) CEFH

12. අල්ලාහ්ගේ **අල්මූ:නී** යන නාමයෙන් ඔහුගේ කුමන ගුණාංගය විදහා දක්වන්නේ ද?
(1) ධනවතා
(2) ධනවත් බවට පත්කරන්නා
(3) විශාල ලෙස ලබාදෙන්නා
(4) අධික ලෙස උදව් කරන්නා

13. පහත දේ අතර සෘජු විරුද්ධ අර්ථ දැක්වෙන වචන යුගලය කුමක් ද?
(1) යව්මුල් කියාමා - යව්මුල් ආහිරා
(2) කල්බුන් සලීම් - කල්බුල් මුත්මඉන්නා
(3) ඊමාන් - කුෆ්ර්
(4) අඛ්ලාක් හසනා - මකාරිමුල් අඛ්ලාක්

14. අනෙක් ආගමිකයින්ට ගෞරවකොට සිටීම, මධ්‍යස්ථභාවය රැකීම වැනි දේ ඉස්ලාම් දේශනා වේ. මේවා,
(1) වසතිය්යා සම්බන්ධ වූ දේවල් වේ.
(2) අව්ලවිය්යාත් සම්බන්ධ වූ දේවල් වේ.
(3) තස්කියා සම්බන්ධ වූ දේවල් වේ.
(4) ඉලාහිය්යාත් සම්බන්ධ වූ දේවල් වේ.

15. පහත වගුවේ **'අ'** තීරුවේ කුර්ආන්හි සඳහන් ඇතැම් අයගේ ක්‍රියාවන් සහ **'ආ'** තීරුවේ එම ක්‍රියාවන් සඳහන් අල් කුර්ආන් සූරාවල නම් සඳහන් වේ.

| | අ | ආ |
|---|---|---|
| (i) | තරුණ වයසේ දී පවිත්‍රතාවය සුරැකි නබි පිළිබඳ ඉතිහාසය | A - සූරා **කහ්ෆ්** |
| (ii) | සමාජය වහල්භාවයෙන් මුදවාගත් මූසා නබිතුමාගේ ඉතිහාසය | B - සූරා **බකරා** |
| (iii) | **ෂිර්ක්** හි නියැලුනු සමාජය බේරාගැනීමට උත්සාහ කළ නබි ඉබ්රාහීම් ඉතිහාසය | C - සූරා **අ:රාෆ්** |
| (iv) | රාජ්‍ය බලපෑම්වලින් මිදී ඊමානය ආරක්ෂා කරගත් තරුණයින් පිළිබඳ ඉතිහාසය | D - සූරා **යූසුෆ්** |

ඉහත **'අ'** තීරුවේ අනුපිළිවෙළට ගැලපෙන පරිදි **'ආ'** තීරුව සකස් කළ විට ලැබෙන නිවැරදි වරණය තෝරන්න.
(1) ACBD
(2) BCAD
(3) DCAB
(4) DCBA

16. උමර් (රළි) තුමා සහ ක්‍රිස්තියානිවරුන් අතර ඇතිකර ගත් 'උමර් ගිවිසුම' අත්සන් කළේ කුමන ස්ථානයේ ද?
(1) මදීනා
(2) කුද්ස්
(3) කුබා
(4) කෛරවාන්

17. **තර්බිය්යා** යන්නෙහි අර්ථය කුමක් ද?
(1) ශාරීරික අභ්‍යාස
(2) දේව බිය
(3) අධ්‍යාත්මික සහ සාරධර්ම පුහුණුව
(4) පවින් මිදීම

18. ශ්‍රී ලංකාවේ 'සර් සෙය්යද් අහ්මද් ඛාන්' යන ගෞරවනාමයෙන් හැඳින්වූයේ කවුරුන් ද?
(1) එම්. සී. සිද්දිලෙබ්බේ විද්වතා
(2) ආචාර්ය බදියුදීන් මහුමුද්
(3) ඒ. එම්. ඒ. අසීස් විද්වතා
(4) ආචාර්ය ටී. බී. ජයා

19. "අල්ලාහ්ගේ විධානයන්ගෙන් ඔබගේ ආශාවන් තුරන් කරන්න. ඥානය ලබා ගැනීමට සුදුස්සෙක් බවට ඔබ පත්වෙයි." යන තාර්කික අදහස ප්‍රකාශ කළ තැනැත්තා වන්නේ,
(1) ඉමාම් ගස්සාලි (රහ්) ය.
(2) ඉබ්රාහීම් ඉබ්නු අද්හම් (රහ්) ය.
(3) පුලෛල් ඉබ්නු ඉයාල් (රහ්) ය.
(4) මුහියුද්දීන් අබ්දුල් කාදිර් ජීලානි (රහ්) ය.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...



**20.** පුතාගේ භාර්යාව **මහ්රම්** ලෙස සැලකීමට හේතුවන සාධකය කුමක් ද?
(1) පවුල් සබඳතාවය (2) විවාහ සබඳතාවය (3) ලේ නෑකම (4) සාම්ප්‍රදායික සබඳතාවය

**21.** ඉස්ලාම් අකීදාහි සංවේදී ඉන්ද්‍රියන්ට හසුනොවන ජින්වරු, මලක්වරු, රූහ් වැනි දේ ගැන සඳහන් අංශය වන්නේ,
(1) අර් - රූහානියියාත් ය. (2) අන් - නුබුව්වාත් ය.
(3) අස් - සම්ඉයියාත් ය. (4) අල් - ඉලාහියියාත් ය.

**22.** පහත සඳහන් දේ අතුරෙන් කලීෆා උමර් (රලි) තුමා ඉටුකළ සේවාව වන්නේ,
(1) හිජ්රි වර්ෂය හඳුන්වා දීමයි. (2) අල් කුර්ආන් ග්‍රන්ථකරණයයි.
(3) නාවික හමුදාව ස්ථාපිත කිරීමයි. (4) කොන්ස්තන්තිනෝපලය ජයග්‍රහණය කිරීමයි.

**23.** **තර්තීබුත් තිලාවත්** යන්නෙන් අර්ථවත් වන්නේ කුමක් ද?
(1) අල්-කුර්ආන් ග්‍රන්ථයක් ලෙස එකලස් කර ඇති අනුපිළිවෙළ
(2) අල්-කුර්ආන් දායාද වූ අනුපිළිවෙළ
(3) අල්-කුර්ආන් පාරායනය පිළිවෙළ
(4) අල්-කුර්ආන් වදන් පහළ කිරීමට හේතු

**24.** **තවක්කුල්** යන්නෙන් අර්ථවත් වන්නේ,
(1) සුරක්ෂිතව හැසිරීම ය. (2) අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කිරීම ය.
(3) උත්සාහයෙන් පසු අල්ලාහ්ට භාර කිරීම ය. (4) අල්ලාහ්ගේ තෘප්තිය අපේක්ෂා කිරීම ය.

**25.** හසීනා බාලවයස් කාලයේ දී ම තම පියා අහිමිව තම මවගේ රැකවරණය යටතේ ජීවත් වූ කෙනෙකි. ඇය මනමාලියක් වීමේ දී ඇයට **වලී** ලෙස පෙනීසිටීමට වඩාත් සුදුසු වන්නේ පහත අයගෙන් කවුරුන් ද?
(1) හසීනාගේ මවගේ සහෝදරියගේ ස්වාමිපුරුෂයා
(2) හසීනාගේ පියාගේ සහෝදරයා
(3) හසීනාගේ මවගේ සහෝදරයා
(4) හසීනාගේ සහෝදරියගේ ස්වාමිපුරුෂයා

**26.** පහත වගුවේ **'අ'** තීරුව අනුව ගැලපෙන පරිදි **'ආ'** තීරුවෙහි නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.

| | අ | ආ |
|---|---|---|
| (i) | හුදෛබියා | A - සහාබාවරු |
| (ii) | අකබා | B - යුදෙව්වන් |
| (iii) | මදීනා ගිවිසුම | C - කුරෙෂිවරු |
| (iv) | බෛඅතුර් රිල්වාන් | D - අව්ස්-හස්රජ් |

(1) BACD (2) CDAC (3) CDBA (4) DCBA

**27.** ජමාඅත් යාඥාව සඳහා පල්ලියට යතුරු පැදියකින් යමින් සිටි සමීම් මාර්ගයේ හමු වූ ඔහුගේ මිතුරා හිස් ආවරණයක් (හෙල්මට්) නොමැතිව නග්ගවාගෙන පල්ලියට ගියේ ය. මෙම ක්‍රියාව කෙසේ සැලකිය හැකි ද?
(1) සහෝදරත්වය වර්ධනය කිරීමට උදව් වීම
(2) කුසල් වැඩියෙන් රැස්කිරීමට උපකාරි වීම
(3) උදව් කිරීමේ මානසිකත්වය වර්ධනය කිරීම
(4) නීති ගරුක නොවූ ක්‍රියාවක් කිරීම

**28.** **අල්-හදීස්** ඉස්ලාම්හි පදනම් මූලාශ්‍රයන්ගෙන් එකක් බවට පත්වීමට ප්‍රධාන හේතුව වන්නේ පහත ඒවායින් කුමක් ද?
(1) නබිතුමාව අනුගමනය කිරීමට අල්ලාහ් නියෝග කොට තිබීම
(2) සහාබාවරු නබිතුමාව අනුගමනය කොට තම ජීවිතය සකස්කරගෙන තිබීම
(3) අල්-කුර්ආන් මෙන්ම අල්-හදීස් ද ආරක්ෂා කර තිබීම
(4) හදීස් ඉස්ලාම්හි නීති මූලාශ්‍රයක් ලෙස මුස්ලිම් උම්මත් පිළිගෙන තිබීම

**29.** **කුල්උ** යන්න ගැන පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ස්වාමිපුරුෂයා, භාර්යාව තලාක් කිරීමයි.
(2) ස්වාමිපුරුෂයා, භාර්යාව තම මව හා සංසන්දනය කිරීමයි.
(3) භාර්යාව, තම ස්වාමිපුරුෂයාව තලාක් කිරීමයි.
(4) විවාහය අවලංගු කිරීමයි.

[තෙවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...



30. පහත සඳහන් ප්‍රකාශ සම්බන්ධයෙන් නිවැරදි වරණය තෝරන්න.
A - **තක්බීර් තහ්රීමා, දුආඋල් ඉෆ්තිතාහ්** එකිනෙකට වෙනස් වූ දේවල් වේ.
B - කුර්ආන් සඳහන් කරන **හික්මා** යන පදය ඥාණය වන බව ඉමාම් මාලික් (රහ්) සඳහන් කර ඇත.
C - zසකාත් අනිවාර්ය වීමට ඇති සාධක අතර නිසාෆ් අන්තර්ගත වීම, වර්ෂය සම්පූර්ණ වී තිබීම ආදිය ද ඇතුළත් වේ.
D - හජ් වන්දනාවේ දී පිරිමින් හිස් ආවරණය කිරීමත්, ස්ත්‍රීන් මුහුණ ආවරණය කිරීමත් වැරදි නොවේ.
(1) A, B පමණක් නිවැරදි ය.
(2) A, C පමණක් නිවැරදි ය.
(3) A, B, C පමණක් නිවැරදි ය.
(4) A, C, D පමණක් නිවැරදි ය.

31. **හනීෆ්වරු** යන්නෙන් හැඳින්වූවන් කවරහු ද?
(1) ජාහිලියියා සමයේ ෂිර්ක් හි සම්බන්ධ නොවූ අය
(2) නබිතුමාට තර්ජනය කළ අය
(3) අග්නි පූජා කළ අය
(4) අබිසීනියා හිජ්රත්හි සහභාගී වූවන්

32. "ඔබ අල්ලාහ්ගේ සතුරා නිසා ඔබව යුද්ධයේ දී මරණයට පත්කිරීමට උත්සාහ කළෙමි. ඔබ මා වෙත කෙළ ගැසූ විට මගේ සතුරා බවට පත්වූ බැවින් ඔබව මරා දැමීමෙන් අල්ලාහ්ගෙන් ප්‍රශංසා නොලැබේ." මෙම ප්‍රකාශය සිදුකර සතුරා මුදාහැරි පුද්ගලයා,
(1) කාලිද් ඉබ්නු වලීද් (රලි) ය.
(2) මු ආවියා (රලි) ය.
(3) උමර් (රලි) ය.
(4) අලි (රලි) ය.

33. පිරිසිදු අකීදා සුරක්ෂා කිරීමට, ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් (රහ්) තුමා විශේෂයෙන් හඬ නැගුයේ කාගේ චින්තනයට විරුද්ධව ද?
(1) ෂිආ
(2) මුඃතසිලා
(3) අෂ්අරියියා
(4) කවාරිජ්

34. **රජාබ්, කබූල්** යන වචන භාවිත කරන කටයුතු දෙකක් වන්නේ,
(1) විවාහ, දික්කසාද වේ.
(2) ගිවිසුම්, සාක්ෂි වේ.
(3) ගනුදෙනු, විවාහ වේ.
(4) දඬුවම්, නිදහස් කිරීම වේ.

35. **තයම්මුම්** කරන අංගයන් මොනවා ද?
(1) මුහුණ සහ පාද දෙක
(2) මුහුණ සහ අත් දෙක
(3) මුහුණ සහ හිස
(4) පාද දෙක සහ අත් දෙක

36. හුදෛෆතුල් යමානි(රලි) යන නබිතුමාගේ මිත්‍රයාව කෙසේ හඳුන්වන්නේ ද?
(1) කලීෆා උමර් (රලි) ගෙන් පසු අල්-කුර්ආනය තමාගේ ආරක්ෂාවේ තබාගත් පුද්ගලයා
(2) අල්-කුර්ආන් දායාද කරන ලද සමයේ කාතිබුල් වහි ලෙස සිටි පුද්ගලයා
(3) අල්-කුර්ආන් එකලස් කිරීමේ අවස්ථා තුනකට සම්බන්ධ වූ පුද්ගලයා
(4) කලීෆා උස්මාන් (රලි) සමයේ අල්-කුර්ආන් එකලස් කිරීමට මුල් වූ පුද්ගලයා

37. **රබ්බුල් ආලමීන්** යන්නෙහි අදහස කුමක් ද?
(1) ලෝකයන්හි පරමාධිපති
(2) සියලු ප්‍රශංසා අල්ලාහ්ටමය
(3) අල්ලාහ් තනි කෙනෙකි
(4) ලෝකයේ ඥානය

38. **අල්ලාහුම්ම ඉන්නී අස්අලුක ඉල්මන් නාෆිආ ආ වරිස්කන් තයියිබා වඅමලන් මුතකබ්බලා** යන දුආව කුමන සලාතයේ නැතිනම් සලාත්වලින් පසුව පාරායනය කිරීම සුන්නත් වේ ද?
(1) පස්වේලෙහි සලාතය
(2) මඃරිබ්
(3) සුබ්හ්, මඃරිබ්
(4) සුබ්හ්

39. තුන්දෙනෙකුගේ ඇස් අපාය නොදකිති. ඒවායින් එකක් වන්නේ අල්ලාහ් තහනම් කළ දේ නොබලා වැලකී සිටි ඇස් ය. අනෙක් ඇස්වලින් එකක් වන්නේ,
(1) අල්ලාහ්ව මතු ලෝකයේ දී තම ඇස්වලින් දැකිය යුතු යැයි ආශාකරන ඇස් ය.
(2) නබී (සල්) තුමා දැකිය යුතු යැයි ආශා කරන ඇස් ය.
(3) ස්වර්ගය දැකිය යුතු යැයි ආශා කරන ඇස් ය.
(4) අල්ලාහ්ට බිය වී හැඬූ ඇස් ය.

40. කලීෆා උස්මාන් (රලි) තුමාගේ සමයේ ඉස්ලාම් රාජ්‍ය ව්‍යාප්ත කළ රටවල් මොනවා ද?
(1) අලෙක්සැන්ඩ්‍රියාව, මොරොක්කෝව, ටියුනීසියාව
(2) ආර්ජන්ටිනාව, ස්පාඤ්ඤය, බ්‍රිතාන්‍යය
(3) සෙනගල්, මැඩගස්කර්, ඉන්දියාව
(4) ඉන්දියාව, පාකිස්තානය, නේපාලය

* *

[පස්වැනි පිටුව බලන්න.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2019
## க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2019

විෂයය අංකය / பாட இலக்கம்: **16** විෂයය / பாடம்: **ඉස්ලාම්**

## I පත්‍රය - පිළිතුරු
## Iபத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 04 | 11. | 02 | 21. | 01 | 31. | 01 |
| 02. | 03 | 12. | 02 | 22. | 01 | 32. | 04 |
| 03. | 02 | 13. | 03 | 23. | 03 | 33. | 02 |
| 04. | 03 | 14. | 01 | 24. | 03 | 34. | 03 |
| 05. | 01 | 15. | 04 | 25. | 02 | 35. | 02 |
| 06. | 03 | 16. | 02 | 26. | 03 | 36. | 04 |
| 07. | 04 | 17. | 03 | 27. | 04 | 37. | 01 |
| 08. | 02 | 18. | 04 | 28. | 01 | 38. | 04 |
| 09. | 02 | 19. | 04 | 29. | 03 | 39. | 04 |
| 10. | 03 | 20. | 02 | 30. | 02 | 40. | 01 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු/ மொத்தப் புள்ளிகள் 01 × 40 = 40

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25/40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25/40



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**01.කෙටි පිළිතුරු සපයන්න.**

**i. ෆර්ලු කිෆායත් හඳුන්වාදෙන ක්‍රියා දෙකක් සඳහන් කරන්න.**

- ජනාසා හි වගකීම් ඉටුකිරීම.
- ආගමික විද්වතුන් බිහිකිරීම.
- සමාජයට අවශ්‍ය විද්‍යාඥයන් , විශේෂඥ වෛද්‍යවරුන් යනාදී නිපුණත්වෙයන් යුතු පුද්ගලයින් බිහි කිරීම

(මෙවැනි සුදුසු කරුණු දෙකක් ලියා ඇත්නම් ලකුණු 1X2= 02)

**ii. සමි අල්ලාහු ලිමන් හමිදා යන ඉෘතිදාල්ට පැමිණීමෙන් පසු පාරායනය කලයුතු දුආ ඔබේ භාෂාවෙන් ලියන්න.**

රබ්බනා ලකල් හම්දු මිල්අස්සමාවාති වමිල්අල් අර්ලි වමිල් අමාෂි:ත මින් ෂෙයිඉන් බ:ද්

(ලකුණු 02ක්)

**iii. සුජූද් හි දී බිම ස්පශර් විය යුතු නළල සහ අත් දෙක හැර අනෙක් අංගයන් හතර, දෙක බැගින් සඳහන් කරන්න.**

දෙපය (දෙපයෙහි ඇඟිලි වල ඇතුල් පැත්ත)

දෙදනහිස්

(ලකුණු 02ක්)

**iv. zසකාත් ලාභීන් අතර ෆීසබීලිල්ලාහ් / ඉබ්නු සබීල් යන අය වෙන්කොට දක්වන්න.**

- ෆීසබීලිල්ලාහ් යනු අල්ලාහ්ගේ මාර්ගයෙ හි නියලෙන්නන්
- ඉබ්නු සබීල් යන්න අනුමත ගමනක යෙදී සිට එය සම්පූර්ණ කිරීමට නොහැකිවන අය.

(ලකුණු 02ක්)

**v. හජ්වල නියියත් තබන ක්‍රම අතුරෙන් අල් - ඉෆ්රාද් යන්නෙහි අරථය කුමක් ද?**

- හජ් පමණක් කිරීම සඳහා නියියත් තැබීම.

(ලකුණු 02ක්)

**vi. විධිමත් තලාක් සඳහා ඇති කොන්දේසි වලින් දෙකක් සඳහන් කරන්න.**

- භාර්යාව පිරිසිදු කාලෙය්දී (තුහ්ර්) තලාක් කීම.
- තුහ්ර් කාලෙය් සන්සර්ගයෙහි නොයෙ දී තලාක් කීම.
- ඊලඟ කාලෙය් (තුහ්ර්) දෙවන තලාක් කීම
- ඊලඟ තුහ්ර් කාලෙය් දී තෙවන තලාක් කීම
- තලාක් තුනම එක්වරම කීම.

***(මෙයින් දෙකක් සඳහන් කර ඇත්නම් ලකුණු 02)***

**vii. ඉජාරා හා සලම් යන වෙළඳ ක්‍රම අතර වෙනස සඳහන් කරන්න**

- ඉජාරා - බදු කුළියට දීම
- සලම් - ව්‍යාපාර කිරීම සඳහා අත්තිකාරමෙ සම්පූර්ණ මුදල ගෙවා ඇණවුම් කිරීම
- ඉජාරාවේ දී භාණ්ඩයේ අයිතිය සතු නොවේ, සලම්වලදී ගණුදෙනුවේ දී අයිතිය තමන් සතු වේ.

(ලකුණු 02ක්)

**viii. කලීෆා අලී (රලි)තුමා විසින් ඉටුකරන ලද සේවාවන් දෙකක් සඳහන් කරන්න.**

- රට වැසියන්ගේ අප්‍රසාදයට ලක් වූ සමහර ආණ්ඩුකාරවරුන් සේවයෙන් පහ කිරීම
- කවාරිජ් වරුන්ගේ මැරවරකම් මැඩපැවැත්වීම.
- ‘කුෆා නගරය’ සංවර්ධනය කිරීම.
- පොලිස් දෙපාතර්මේන්තුව ප්‍රතිසංස්කරණය කිරීම.

- නීති විනිශ්චය සඳහා වෙන්වූ ස්ථානයක් ඇතිකිරීම.
- අතරමං වූ හා රැකවරණයක් නොමැති සිවුපා සතුන් සඳහා රැඳවුම් ස්ථාන ඉදි කිරීම.
- සිර මැදිරි නිමර්ාණය කිරීම.
- අල්-කුආර්න් අක්ෂර සඳහා පිල්ලම් යෙදවීම.

***(මේවායින් කරුණු දෙකක් ලියා ඇත්නම් ලකුණු 02ක් පිරිනමන්න)***

**ix. අරාබි ඉතිසාහඥයකු වූ ඉබ්නු ෂහ්රයාර් තුමා අජාඉබුල් හින්දු යන ග්‍රන්ථයේ ශ්‍රී ලංකාව ගැන සඳහන් කළ තෙරතුරු කෙටියෙන් ලියන්න**

ශ්‍රී ලංකාවේ රජෙකු නබි(සල්) තුමාගේ නබිත්වය පිළබඳව තොරතුරු තහවුරු කර ඒමට තම දූතෙයකු අරාබි අර්ධද්වීපයට යැවූ බව

***(ලකුණු 02)***

**x. ඉස්ලාම් ඉතිහාසයේ මිථ්‍යාදෘෂ්ටික චින්තන කණ්ඩායම් බිහිවීමට තුඩදුන් කරුණු සඳහන් කරන්න.**

- දේශපාලනික චින්තනයන්වල බලපෑම
- අන්‍ය සංස්කෘතික චින්තනවල බලපෑම
- විචාරබුද්ධිය සීමාව ඉක්මවා භාවිතා කිරීම
- ස්වකැමැත්ත අනුව ක්‍රියා කිරීම
- දැඩි මතවාදයන් බිහිවීම
- සතුරන්ගේ කුමන්ත්‍රණය
- මිථ්‍යා විශ්වාස

***(මේවායේ කරුණු දෙකක් වත් ලියා ඇත්නම් ලකුණු දෙකක් පිරිනමන්න)***

***මුළු ලකුණු 2 x 10 = 20***

2.

**i. ඉස්ලාම් තහනම් කර ඇති වෙළෙඳාම් ක්‍රම දෙකක් සඳහන් කරන්න.**

- පොලිය
- රැවටීම
- සඟවා තබාගැනීම
- කිරුම් මිනුම්වල දී වංචා කිරීම
- මිශ්‍රකිරීම
- හරාම් වූ දේවල් විකිණීම
- මස්ජිදය තුල වෙළඳම් කිරීම

***මෙවැනි ගැළපෙන කරුණු ලියා ඇත්නම් 01 x 2 = 02***

**ii. මුෂාරකා වෙළඳාම් ක්‍රම ගැන කෙටියෙන් පැහැදිලි කරන්න**

- මුෂාරකා යනු හවුල් ව්‍යාපාරයකි
- මෙය එකකට වැඩිය හවුල් කරුවන් එකතු වී මෙහෙයවන ව්‍යාපාර ක්‍රමයකි
- මෙහි හවුල්කරුවන් වන ව්‍යවසායකයින් ප්‍රාග්ධනය, මානව සම්පත් සියල්ලෙහිම තම ශක්තීන්වලට අනුව දායක විය හැක.
- ලාභ හා අලාභ තමන්ගෙ කොටස් හා දායකත්වය අනුව බෙදනු ලැබේ.
- මෙය ඉතා විශාල ඉපයීම්වලට ඉතා උචිත ව්‍යාපාරික ක්‍රමයකි

***(මෙවැනි කරුණු තුනක් ලියා ඇත්නම් 01 x 3 = 03)***

WWW.OLEVELAPI.COM

**iii. භාණ්ඩ ගනුදෙනු කිරීමේ දී පිළිපැදිය යුතු ෂරීආ සීමාවන් කුමක් ද?**

- හරාම් වූ ද්‍රව්‍යයක් විය නොයුතුය (උදා: මත්පැන්, සොරකම් කරන ලද භාණ්ඩ)
- හරාම් වූ ක්‍රමවේදයන් ප්‍රාග්ධනය ලෙස නොතිබිය යුතුය (උදා: මංකොල්ල, පොලී, අල්ලස්)
- ජනතාවට හිරිහැරයක් හෝ රැවටිල්ලක් නොවිය යුතුය (උදා: සැඟවීම, මිශ්‍රකිරීම, පොරොන්දු කැඩීම)
- පොදු නීති උල්ලංඝනය කිරීමේ ක්‍රියාවක් නොවිය යුතුය (උදා: කලු කඩ, නීති විරෝධි ජාවාරම....)
- යහපත් සාරධර්මවලට පටහැනි ක්‍රියාවන් නොවිය යුතුය (උදා :බොරුව, වංචා, ආත්මාර්ථකාමීත්වය)

***( ඉහත කරුණු උදාහරණ සමග ඇත්නම් ලකුණු 5ක් ද , කොන්දේසි පමණක් ලියා ඇත්නම් ලකුණු 03ක් පිරිනමන්න)***

***මුළු ලකුණු 2 + 3+5 = 10***

3.

**i. දාරුල් ෆනා යනු කුමක්ද?**

- විනාශවන සුළු මෙලොව ජීවිතය ***(ලකුණු 02)***

**ii. කත්මුන් නුබුව්වා යනු කුමක් ද? අල් කුරුආන් හදීස් මූලාශ්‍ර එක බැගින් ඉදිරිපත් කරන්න.**

කත්මුන් නුබුව්වත් යනු - අවසන් නබිත්වය වේ.

- අල් කුආර්නෙය් මූලාශ්‍ර - ජනයානෙනි , මුහම්මද් තුමලා අතරින් මිනිස්සුන්ගෙන් කිසිවෙකුට පියෙකු නොවේ. එහෙත් ඔහු අල්ලාහ්ගේ රසූල් වරයා ද නබිවරුන්ගේ අවසානයා වූවාද වේ. (33:40)
- අල් හදීස් මූලාශ්‍රය - මාගේ සමාජය තුල මුසාවාදීන් තිස්දෙනෙක් බිහිවෙති, සියල්ලෝම තමන් නබිවරු බවට වාද කරති. එහෙත් මම නබිවරු සියල්ලන්ටම අවසානයා ලෙස සිටින්නෙමි. මගෙන් පසු වෙනත් කිසිදු නබිවරයෙකු නොපැමිණෙන්නේ (අබූ දාවූද්)
- මා හට නම් කිහිපයක් ඇත. මා මුහම්මද්‍ය, අහ්මද්‍ය, මාහී ය .......... එම නිසා මාගෙන් පසු කිසිම නබිවරයෙකු නොමැත. (බුහාරි, මුස්ලිම්)
- මා අනෙකුත් නබිවරුන්ට වඩා කරුණු 06 කින් විශේෂිත වූවෙකි....... මුළු ලොවටම මා නබිවරයා ලෙස යවන ලදී. මාගෙන් නබිවරුන්ගේ පැමිණීම නිමවේ. (තිර්මිදි, ඉබ්නුමාජා)
- මා හා අනෙකුත් නබිවරුන් අතර සම්බන්ධයට උදාහරණය එක් ගොඩනැගිල්ලක් වැනිය. එහෙයින් එක් හිඩැසක් සම්පූර්ණ නොකර තිබුණි. එම හිඩස සම්පූර්ණ කිරීමට පැමිණීයේ මාය. මාගෙන් නබිවරුන්ගේ පැමිණීම නතර විය. (බුහාරි, මුස්ලිම්)

***ලකුණු 1 + 2 = 03***

WWW.OLEVELAPI.COM

iii. **සූරා ෆුර්කාන් හි සඳහන් වන යහගුණාංග පහක් ලැයිස්තු ගත කොට විස්තර කරන්න.**

- මහපොළවේ යටහත්ව ඇවිදියි.
- අඥානවන්තයන් සමග තර්ක කිරීමෙන් වැලකී සිටියි.
- රාත්‍රි කාලයේ අධික වශයෙන් අල්ලාහ්ට නැමදුමෙහි නියලෙයි.
- නිරයේ වේදනාවලින් රැකවරණය පතා ප්‍රාර්ථනා කරයි.
- නාස්තියෙන් හා ලෝභකමින් තොරව මධ්‍යස්ථව සිටියි.
- අල්ලාහ්ට ආදේශ නොකරයි
- කිසිවකු ඝාතනය නොකරයි
- බොරු සාක්ෂි පැවසීමෙන් වැලකී සිටියි
- දුරාචාරයෙන් ඈත්වී තමන්ව ආරක්ෂා කර ගනියි.
- අනපේක්ෂිත දූෂිත ක්‍රියාවක් දුටුවේනම් ඒයින් ගෞරවාන්විතව ඉවත්වේ
- සතුටු දායක පවුල් දිවියක් පතා ප්‍රාර්ථනා කරයි

***(මෙහි කරුනු 5ක් කෙටියෙන් විස්තර කර ඇත්නම් 01 x 5 = 05 විස්තර නැතුව සඳහන් කර ඇත්නම් ලකුණු 02)***

***මුළු ලකුණු 2 + 3+5 = 10***

4. i. **zසකාත් හි සමාජයීය ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න**

- සමාජයේ අන්‍යෝන්‍ය සෙනහස, සාමූහික වගකීම, ,එකමුතුභාවය යනා දී වර්ධනය වීම
- සමාජයේ විශාල ආර්ථික විෂමතාවයක් ඇති නොවීමට මගපාදයි
- දුගී බව තුරන් කිරීමට උපකාරී වේ, මෙයින් සොරකම, මංකොල්ල වැනි අපරාධ පිළිබඳ බිය පහව ගොස් ජනසමාජයට සැනසීමෙන් හා ආරක්ෂාවෙන් සිටීමට හැකිවේ
- zසකාතය ආර්ථික වර්ධනයට මග පාදයි, තම සම්පත් zසකාත් මගින් නොඅඩුව රැකෙයි. ආර්ථික වර්ධනය සක්‍රිය වේ.
- විරැකියා ගැටළුව විසඳීමට සකාත් මග පාදයි, රැකියාවක් ඇරඹීමට මූලික ප්‍රාග්ධනයක් නොමැත්තන්ට ප්‍රාග්ධනය ලබා දීමටත්, රැකියා පුහුණුව ලබා දීමටත් මග පාදයි.

***(මෙවන් කරුණු දෙකකට ලකුණු 01 x 2 = 2ක් පිරිනමන්න)***

WWW.OLEVELAPI.COM

ii. **උපවාසයෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න**

- උපවාසයේ විශිෂ්ඨත්වය සම්බන්ධ ප්‍රයෝජන
  - අවසන් දිනෙය් උපවාසය ගැත්තාට කන්නලව් කරයි.
  - පාපයන් වලට සමාව ලබාදෙයි.
- අධ්‍යාත්මික ප්‍රයෝජනයන්
  - ගණනය කල නොහැකි ආනිසංස අත්වේ.
  - ස්වගර්යට විශේෂිත වූ දොරටුවෙන් පිවිසීමට භාග්‍ය ලැබෙයි
  - දේව භක්තිය ඇතිකරයි
- ලෞකික ප්‍රයෝජනයන්
  - දුගියාගේ දුෂ්කරතා හඳුනාගැනීමට උපකාරී වේ
  - ශාරීරික නිරෝගී බව ඇති කරයි.

***(මෙවැනි මාතෘකා 3හි අඩංගු වන පරිදි කරුණු 3ක් ලියා ඇත්නම් ලකුණු 01 x 3 = 3ක් පිරිනමන්න)***

iii. **සලාත්වල වැදගත්කම සඳහන් කොට, එ මගින් ලැබෙන සමාජ ප්‍රතිලාභ 3ක් පැහැදිලි කරන්න.**

සලාතයේ වැදගත්කම පිළිබඳව කුර්ආන්, සුන්නාහි සාධක මගින් පැහැදිලි කරන්න.

- අල් කුආර්න් - ''සත්‍ය වශයෙන්ම සලාතය විශ්වාසීන්ට වේලාව නියමකරන ලද වගකීමකි'' (4:103)
- ''ඔවුන් සැඟවුණු දේ විශ්වාස කරන්නා හුය සලාතය ඉටුකරන්නාහුය'' (2. 2-3)
- අල් හදීස් - ''කවෙරකු හට සලාතයක් මගහැරෙන්නේද ඔහු තම පවුල, වස්තුව යනා දිය අහිමිව සිටින මිනිසෙකුට සමානය'' (ඉබ්නු හිබ්බාන්)
- ''මු:මින් වරෙයකු හා කාෆිවර්රෙයකු අතර වෙනස සලාතය අතහැරීමය'' (මුස්ලිම්)
- ''අවසන් දිනෙය් දී ප්‍රථමෙයන්ම විමසනු ලබන්නේ සලාතය ගැනය'' . ..............................

- **සමාජීය ප්‍රයෝජනය**
- පුද්ගලයන් අතර අන්‍යෝන්‍ය සබඳතා ඇති කරයි
- නායකත්වයට අවනත වීමේ පුහුණුව ලබා දෙයි.
- සමානාත්මකතාවය , සහෝදරත්වය ගොඩ නැගේ.
- දුෂ්කරතා හඳුනාගෙන උදව් කිරීමට අවස්ථාව සලසයි
- කාල කළමණාකරන පුහුණුවක් ලබා දෙයි.

***(සලාතයේ වැදගත්කමට ලකුණු 2ක් ද සමාජ ප්‍රයෝජනයන් සඳහා ලකුණු 3ක් ද පිරිනමන්න)***

***මුළු ලකුණු 2 + 3+5 = 10***

5.

(i) **ඉජ්තිහාද් යනු කුමක්ද?**

- ඉජ්තිහාද් යනු උත්සාහය වේ, අලුත් ප්‍රශ්නයකට විසඳුම අල්කුආර්නයේ හෝ හදීසයේ සෘජුව ලබා ගැනීමට නොහැකි වූ කල එහි අනුසාරයෙන් මුජ්තහිද්වරුන් විසඳුමක් ලබා ගැනීමට ගන්නාවූ උත්සාහය වේ.

***(ලකුණු 02)***

(ii) **ඉජ්මාහි වර්ග දෙක සඳහන් කොට එයින් එකක් පැහැදිලි කරන්න**

- ඉජ්මා සරීහ්
- ඉජ්මා අක්සරියියා
- ඉජ්මා සුකූති

***(ලකුණු ½ x 2 = 01)***

- ඉජ්මා සරීහ් :- පැහැදිලි ඉජ්මාඋ යනුවෙන් මෙය හැඳින්විය හැකි ය. නිශ්චිත කාලයක දී ජීවත් ව සිටින සියලු ම මුජ්තහිද්වරුන් ඒකමතික තීරණයකට එළඹුනු බව යනුවෙන් වාග්මාලාවලින් එළිවූවිට එම තීරණය මෙසේ **හඳුන්වනු** ලැබේ. මෙය ඉජ්මාඋල් කෞලී යනුවෙන් ද හැඳින්වේ.
- ඉජ්මා අක්සරියියා:- බහුතරයගේ තීරනයට මෙසේ කියනු ලැබේ. යම් ගැටළුවක දී මුජ්තහිද්වරු බහුතරයගේ තීරණය මෙයින් ප්‍රකාශෙවි.
- ඉජ්මා සුකූති :- නිශ්ශබ්ද වූ ඉජ්මාව යනුවෙන් මෙය හැඳින්වේ. නිශ්චිත කාල සීමාවක් තුළ ජීවත්වන මුජ්තහිද් වරුන්ගේ කෙනෙකුගේ එළඹෙන තීරණයකට කැමැත්ත හෝ අකැමැත්ත ප්‍රකාශ නොකර නිහඬව සිටීමට මෙසේ කිව හැකිය

***(මෙයින් එකක් කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු 02 )***

WWW.OLEVELAPI.COM

(iii) **ෆික්හ් යනු කුමක්ද? යන්න සඳහන් කොට මද්හබ්වල ඉමාම්වරු හතරෙදනා කෙටියෙන් හඳුන්වා දෙන්න.**

- ෆික්හ් යනු ඉස්ලාමීය නීති විග්‍රහය වේ *ලකුණු 01*

| නම | ජීවිතය | ස්වාභාවික නම | අනුවර්ථන නම | ගම | ග්‍රන්ථ |
|---|---|---|---|---|---|
| 1.ඉමාම් අබූ හනීෆා (රහ්) | 80-150 | නු:මාන් ඉබ්නු සාබිත් | ඉමාමුල් අ:ලම් | කූෆා | ෆික්හුල් අක්බර් |
| 2.ඉමාම් මාලික් (රහ්) | 93-179 | මාලික් ඉබ්නු අනස් | ඉමාමුල් මදීනා | මදීනා | මුවත්තා |
| 3.ඉමාම් ෂාෆිඊ (රහ්) | 150-204 | මුහම්මද් ඉබ්නු ඉද්රීස් | ආලිමුල් කුරෙයිෂ් | පලස්තීන් ගාසා | කිතාබුල් උම්මු, රිසාලා |
| 4.ඉමාම් අහ්මද් | 164-241 | අහ්මද් ඉබ්නු හන්බල් | ඉමාමුල් මුම්තහන් | බැග්දාද් | මුස්නද් අහමද් |

***(ෆික්හ් යන්නට ලකුණක්ද ඉමාම්වරු 4 දෙනා පිළිබඳව ඉහත පරිදි තොරතුරු ලබා දී ඇත්තනම් 1x4=4ක් පිරිනමන්න)***

***(මුළු ලකුණු 2 + 3+5 = 10)***

6.

(i). **කුරෙයිෂ්වරුන් නබි තුමාගේ දෑවා වලට විරුද්ධවීමට තුඩුදුන් හේතු දෙකක් ඉදිරිපත් කරන්න**

- නබි (සල්) තුමාගේ දෑවාව කුරෙයිෂ්වරුන් ගේ දැහැමි විශ්වාසයට හා තම මුතුන් මිත්තන්ගේ වැඳුම් පිදුම්වලට පටහැනි වීම
- ඉස්ලාමය වැලඳගත් විට තම පාරම්පරික ජීවිතය රටාවන් අත්හැරීමට සිදුවේ යයි බියවීම
- කුලය ගෝත්‍ර ආඩම්බරයට කැලැලක් ඇතිවේ යයි බියවීම
- නබි(සල්)තුමාගේ දෑවාව ඔවුන්ට අලුත් බවක් පෙනීම
- නබි(සල්) තුමාගේ දෑවාවන් ඒකදේව වාදය අනුසාරෙයන් වීම

***(මෙවැනි කරුණු වලට ලකුණු2ක් පිරිනමන්න)***

WWW.OLEVELAPI.COM

(ii). **සීරාව ඉගෙන ගත යුතුය යන්නට හේතු ඉදිරිපත් කරන්න**

- නබි(සල්)තුමාව අනුගමනය කලයුතුයයි අල් කුආර්න්, පැවසීම
- නබි(සල්)තුමාව ජීවිතෙය් ආදර්ශ ලෙස ගැනීම
- නබි(සල්)තුමාගේ සීරාව සැමට ආදශර්මත් වීම
- සීරාව ඉස්ලාමයේ මූලාශ්‍රය ලෙස තිබීම
- ඉස්ලාමීය ජීවන රටාව නිවැරදිව දැනගැනීමට සීරා පිළිබඳව දැනුම අවශ්‍ය වීම.

**(මෙවැනි කරුණු 2කි ලියා ඇත්නම් ලකුණු 3ක් පිරිනමන්න)**

iii. **සුන්නාහ් වැදගත්කම ගැන අල්-කුර්ආන්, හදීස් මූලාශ්‍ර සහිතව විස්තර කරන්න**

අල් කුර්ආන් -

- ''යමෙකු රසුල් වරයාට කීකරු වේද නියත වශයෙන්ම ඔහු අල්ලාට කීකරු වන්නේය.'' (4.80)
- ''අපගේ දූතයා ඔබට ලබා දුන් දෙය ඔබ හිතට අවංක ව ලබා ගන්න. ඔහු කුමන දෙයින් වළකින ලෙස උපදෙස් දුන්නේ ද ඔබ ඒවායින් වළකින්න. '' (59.07)
- අල් කුආර්නය විග්‍රහය නොකල ද සමහර කරුණු සුන්නා සදහන් කිරීම.උදා: ජනසා සලාතය, ජනාසාවේ යුතුකම්
- සුන්නාවේ වැදගත්කම හදීසිය මඟින් තහවුරු කර ඇත.

අල් හදීසය -

- ''නිශ්චිත වශයෙන්ම මාගේ දෙවිඳුන් මට උගන්වා දුන්නු දෙයින්, ඔබ නොදන්නා දේ ඔබට උගන්වන ලෙස ඔහු මට අණ කළේය'' (මුස්ලිම්)
- ''ඔබලා වෙත කරුණු දෙකක් හැර යමි, එය පිළිපදින තුරා ඔබ නොමඟ නොයන්නෙහිය. එය අල්ලාහ්ගේ ආගම හා ඔහුගේ මඟ පෙන්වීම් ද වේ. '' (මුවත්තා)
- අල් කුර්ආනය කෙටියෙන් සදහන් කර ඇති කරුණු සුන්නාව පැහැදිලි කිරීම සලාතය ඉටු කරන ලෙස අල් කුර්ආනය අණ කල ද එය ඉටුකරන ක්‍රමය වේලාව රකඅත් ගණන පිළිබඳව සුන්නාව පැහැදිලි කරයි
- අල් කුර්ආනය පැහැදිලි නොකළ කරුණු සුන්නාවේ සඳහන්ව ඇත. (උදා - ජනාසා සලාතය, සූර්ය හා චන්ද්‍රග්‍රහණ සලාතයන් පිළිබඳව විග්‍රහ කර ඇත්තේ සුන්නාය.
- අල් කුර්ආනය පැහැදිලි කරගැනීමට සුන්නාව මඟ පෙන්වීම
- අල් කුර්ආර්නයේ පොදුවේ සඳහන් වූ කරුණු සුන්නාව මගින් සීමා කොට ඇත. උදා ඃ සොරකමට අදාළ දඩුවම් පිළිබඳව
- අල් කුර්ආර්නය අවබෝධ කරගැනීමට හා ක්‍රියාත්මක කර ගැනීමට සුන්නාව අවශ්‍ය වීම.

***(ඉහත සඳහන් වූ පරිදි කරුණු 5ක් සම්බන්ධයෙන් ලියා ඇත්නම් 1x5=5)***

***මුළු ලකුණු 2 + 3+5 = 10***

***7. පහත සඳහන් ඒවායින් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න***

i. එම්. සී. සිද්දි ලෙබ්බෙ විද්වතානන්

- සම්පූර්ණ නම මොහොමද් කාසිම්. සිද්දි ලෙබ්බේ
- උපත -1838 ජූනි මස, මහනුවර
- විපත - 1898 තම 60 වන වියේදී මහනුවර
- මහනුවර දිස්ත්‍රික් නීතිඥ , ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ
- මහනුවර අධිකරණ විනිශ්චකරු
- ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ප්‍රථම පුවත් පත්වේදියා - මුස්ලිම් නේෂන් , ඥානදීපම් යනාදී ප්‍රකාශනය
- පුවත්පත් සඟරා මගින් අධ්‍යාපනය හා ආගමික පුනරුදය ඇති කිරීම
- සහිරා විද්‍යාලය ඇතිකිරීම
- මුස්ලිම් පාසල් ස්ථාපිත කිරීම (කොළඹ, මහනුවර, ගම්පොළ)
- බාලිකා පාසල් ස්ථාපිත කිරීම - මහනුවර
- ''අසන්බෙ සරුත්තිරම්'' නව කථාව හා ඉස්ලාම් පෙළපොත් ප්‍රකාශනය

***(ඉහත සඳහන් කරුණුවලින් පහක් ලියා ඇත්නම් 1x5 = 5 පිරිනමන්න)***



WWW.OLEVELAPI.COM

**ii. ශ්‍රී ලංකා පුරවැසියෙක් ලෙස මුස්ලිම් වරයෙකු පිළිපැදිය යුතු පිළිවෙත්**

- මාතෘ භූමියට ආදරය කිරීම
- රට වැසියන්ට විශ්වාසවන්ත වීම
- හැඟීම් වලට ගරු කිරීම
- මාතෘ භූමියේ එකමුතුකම වෙනුවෙන් කටයුතු කිරීම
- රට ජාතිය මුහුණ දෙන අභියෝග වලින් දේශය ආරක්ෂා කිරීම
- රටේ නීතිවලට ගරු කිරීම
- පොදු කටයුතුවලදී පෞද්ගලික ආගමික හා ජාතිවාදී පටු මානසිකත්වයෙන් මිදීම
- සමාජ විරෝධී ක්‍රියා තුරන් කිරීමට සහයෝගය ලබා දීම
- අන් සමාජ සමග හැසිරීම සම්බන්ධව නබි (සල්) තුමාණන් ජීවිතයේ පෙන්වූ ආදශර්යන් අනුගමනය කිරීම
- සහෝදර ජනතාව සමග මිත්‍රශීලීව සාකච්ඡා පැවැත්වීම
- ජාතික භාෂාවන් ඉගෙන ගැනීම
- මව්බිම වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම
- මව්බිමේ ආරක්ෂාව රැකීම සහ අභිවෘද්ධිය ඇති කිරීම සඳහා දායකත්වය ලබාදීම

***(ඉහත සඳහන් කරුණුවලින් පහක් ලියා ඇත්නම් 1x5 = 5 පිරිනමන්න)***

**iii. අජ්නබිවරුන් සමග සීමාවන් සුරැකීම**

- බැල්ම පාලනය කරගැනීම
- අවුරතය සම්පූර්ණයෙන්ම ආවරණය වන පරිදි හා ගරුත්වය රැකෙන පරිදි ඇඳුම් ඇඳීම
- ඇවිදීම, ඇඳුම් ඇඳීම, හැසිරීම හා කතා රටාව වැනි සියළුම කරුණු ඉස්ලාමීය චාරිත්‍රයට අනුව පිළිපැදීම
- කාමය ඇවිස්සෙන ක්‍රියා වල නොයෙදීම
- සමාජයේ යහපත් ක්‍රියාවලියේ දී ඉස්ලාමයට අනුකූලව කටයුතු කිරීම
- අජ්නබි වූ ස්ත්‍රී පුරුෂ හුදකලා වීමට ඇති අවස්ථා සීමා කිරීම

***(ඉහත සඳහන් කරුණුවලින් පහක් ලියා ඇත්නම් 1x5 = 5 පිරිනමන්න)***

WWW.OLEVELAPI.COM

**iv. ජීවිතය වන්දනයකි**

- ඉස්ලාමයේ අනුමැතිය තිබීම
- පිවිතුරු චේතනාවෙන් ඉටු කිරීම
- ඉස්ලාමයේ සීමාව අනුගමනය කිරීම
- මූලික වතාවත්වලට අවහිර නොවීම
- නිවැරදිව හා පිළිවෙත ඉටු කිරීම
- මුස්ලිම්වරයෙකුගේ ජීවිතයම ඉබාදත් වීම
- ජීවිතයේ සියලූ අවස්ථාවල දී අල්ලාහ් අනුමත කළ දෑ කිරීමෙන් හා අල්ලාහ් අනුමත නොකල ක්‍රියාවලින් වැළකී සිටීම.

***(ඉහත සඳහන් කරුණුවලින් පහක් ලියා විස්තර කර ඇත්නම් 1x5 = 5 පිරිනමන්න)***

***(මුළු ලකුණු 2 + 3+5 = 10)***